**කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය -2020**

---

කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යනයේ 2020 ජුලි 23 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020 ජුලි 23 දිනැති අංක 6727එල්කේ සහ 6728 එල්කේ දරන මූල්‍ය ගිවිසුම්වල 4 ව්‍යවස්ථාවේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් හා කාලසීමාව

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය වර්තමානයේ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වසංගත කාලය තුළ පොරොත්තු ලේඛනයේ සිටින අයදුම්කරුවන් ඇතුළුව පවතින මුදල් ලබාදීමේ වැඩසටහන මගින් ආබාධ සහ නිදන්ගත රෝග සහිත වැඩිහිටියන්ට වැඩි මුදලක් ලබාදීම සහ වසංගත කාලය තුළ පවතින මුදල් ලබාදීමේ වැඩසටහන යටතේ වැඩි කරන ලද මුදලක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,248.45 කට සමාන එ.ජ.ඩො මිලියන 87.24ක් ලබාදීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2020 ජුලි 23 දින ආරම්භකර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

2.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | වකුගඩු රෝගීන්, ආබාධිතයන් සහ වයස අවුරුදු 70 සහ 100 වැඩි අඩු ආදායම් ලාභී වැඩිහිටියන්ට කරන ලද දීමනා ප්‍රතිපූර්ණය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ණය මුදල් රු. මිලියන 5,602 ක් බෙදා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරු විසින් පවත්වා ගෙන තිබුණු පොත් අනුව අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් ලබා දෙන ලැබූ ණය මුදල්වලින් ලැබීම් සහ ප්‍රතිපූර්ණයන් භාණ්ඩාගාර අරමුදල්වලින් වෙනම හඳුනාගැනීමට නොහැකිවේ. | ව්‍යාපෘතියේ 1.2 සංරචකය යටතේ මුදල් ලැබීමට සුදුසු ප්‍රතිලාභීන්ගේ වාර්තා රාජ්‍ය අමාත්‍යාංශය නඩත්තු කරනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති කාර්යාලය මගින් සමස්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. | ව්‍යාපෘතිය වෙනත් දීමනාවලින් ව්‍යාපෘතියේ වියදම් වෙනම වාර්තා කළ යුතු අතර ව්‍යාපෘති වියදම් වෙනම වාර්තා කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීමත් ව්‍යාපෘති කාර්යාලය වෙත මාසිකව වාර්තා කිරීමටත් දැන්විය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 5,602ක් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ආපසු ලබා ගැනීම්වල අනුරූපි වටිනාකම රු. මිලියන 5,341.48ක් විය. කෙසේ වෙතත්, රු. මිලියන 250.90ක වෙනස සඳහා හේතු විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි. | ලබා ගැනීම්වල සඳහන් වටිනාකම සහ ප්‍රතිපූර්ණය කරන ලද මුදල අතර වෙනස ව්‍යාපෘතියේ ගිණුම් පවත්වා ගෙන යනු ලබන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සනාථ කර ගත යුතුය. | වෙනස සැසඳිය යුතු අතර අදාළ ලෙජර් ගිණුම්වලට සුදුසු ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඇ) | ලැබී තිබුණු තොරතුරු අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද රු. මිලියන 19.5ක ඉදිරිපෙළ ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවලට ඉදිරිපෙළ ගාස්තුව ගිණුම්ගත කළ යුතුය. |

**2.2** නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| **(i)** | මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛණයේ (ඇ) වගන්තිය | අමාත්‍යාංශය තුළ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් ස්ථාපනය කර පවත්වා ගෙන නොතිබුණි. | ලෝක බැංකුව වෙත සුදුසුකම්ලත් වියදම් පිළිබඳ වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වේ. | අමාත්‍යාංශය වෙත වග කියන ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |
| **(ii)** | ව්‍යාපෘති පත්‍රිකා අංක පීඒඩී **4021** | | | |
| | (අ) **45** වගන්තිය | ව්‍යාපෘති පත්‍රිකාව අනුව, ව්‍යාපෘතිය යටතේ මූල්‍ය කළමනකරණ කටයුතු කළමනාකරණයට ව්‍යාපෘතිය ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් යොදවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතිය යටතේ මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතුය. |
| | (ආ) **51** වගන්තිය | ව්‍යාපෘතිය දිස්ත්‍රික් කාර්යාලවලින් සියළුම කාණ්ඩවලට ආවරණය වන පරිදි කරන ලද ගෙවීම්වලට අදාළ මාසික වියදම් රැස්කර වාර්තා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතිය දිස්ත්‍රික් කාර්යාලවලින් සියළුම කාණ්ඩවලට ආවරණය වන පරිදි කරන ලද ගෙවීම්වලට අදාළ මාසික වියදම් රැස්කර වාර්තා කළ යුතුය. |
| **(iii)** | **1994** අප්‍රේල් **20** දිනැති **30/94** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | | | |
| | (අ) **5.6.2** වගන්තිය | චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතිය වෙනම අග්‍රිම සහ බැංකු ගිණුමක් මත ක්‍රියාත්මක විය යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය වෙනම අග්‍රිම සහ බැංකු ගිණුමක් පවත්වා ගෙන නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන මගින් කෝවිඩ් - **19** මගින් බලපෑමට ලක් වූ සුදුසු පුද්ගලයින් සඳහා රු. **5,000** ගෙවීම කර තිබුණි. | ව්‍යාපෘතිය වෙනම අග්‍රිම සහ බැංකු ගිණුමක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ) **5.6.6** වගන්තිය | චක්‍රලේඛයට අනුව, සියළුම හිමිකම් සහතික කරන ලද වියදම් ප්‍රකාශවලින් සමන්විත විය යුතුය. කෙසේවෙතත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මාසික වියදම් විස්තරය සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් වෙත කරන ලද ගෙවීම් පදනම් කර ගනිමින් පිළියෙල කර ඇති අතර ප්‍රතිපූර්ණය සඳහා මුදල් ඉල්ලීමේ අයදුම්පත්‍ර සමග ඒවා ඉදිරිපත් කර ඇත. | සියළුම හිමිකම් පෑම් සහතික කරන ලද වියදම් ප්‍රකාශවලින් සමන්විත විය යුතුය. |
| | (ඇ) **5.6.11**වගන්තිය | චක්‍රලේඛයට අනුව, ප්‍රතිපූර්ණ ඉල්ලීම් සහ ලැබීම් සංසන්දනය කළ යුතු අතර කිසියම් වෙනසක් පවතී නම් ණයනියෝජිතායතනය සමග විසදාගත යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය සංසන්දනය කර නොතිබුණි. | මුදල් ඉල්ලීම්පත්වල සඳහන් මුදල සහ ප්‍රතිපූර්ණය කරන ලද මුදල අතර වෙනස ව්‍යාපෘතියේ ගිණුම් පවත්වාගෙන යනු ලබන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සනාථ කර ගත යුතුය. | ප්‍රතිපූර්ණ ඉල්ලීම් සහ මුදල ලැබීම් සංසන්දනය කළ යුතු අතර කිසියම් වෙනසක් පවතී නම් ණයනියෝජිතායතනය සමග විසදාගත යුතුය. |
| **(iii)** | **5.10** වගන්තිය | චක්‍රලේඛ උපදෙස්වලට අනුව, ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට සහ පිළිගත් ගිණුම් මූලධර්ම අනුකූලව පවත්වා ගෙන නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින ව්‍යාපෘති කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන මව් ව්‍යාපෘතිය සඳහා වෙනම විගණන වාර්තාවක් පිළියෙල කරනු ලැබේ. | පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියේ ගිණුම් වාර්තා මත වාර්ෂික ගිණුම් පිළියෙල කළ යුතුය. |
| **(iv)** | **2020** පෙබරවාරි ජීඑස්/එස්එෆ්එස්/**2021/65** දරන විගණකාධිපතිගේ චක්‍රලේඛය | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන **2021** පෙබරවාරි **28** දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවද, **2021** අගෝස්තු **16** දින ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා නියමිත දිනයන්ට ඉදිරිපත් කළ යුතුය. |

**3.** මූල්‍ය කාර්යසාධනය

---------------------

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ මූල්‍ය ප්‍රගතිය

-----------------------------------------------

කොවිඩ් වසංගතයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්ට පහසුකම් සැපයීමේ අරමුණින් රජය වකුගඩු රෝගීන්, ආබාධිතයන් සහ වයස අවුරුදු **70** සහ **100** වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා දීමනා ලබාදී තිබුණි. පසුව, ඉහත දීමනාව මූල්‍ය කිරීම සඳහා රජය ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමග ණය ගිවිසුමකට එළඹ තිබුණි. ණය නියෝජිතායතනය විසින් කරන ලද රු. මිලියන **16,248.45**කට සමාන එ.ජ.ඩො. මිලියන **87.24**ක මුළු ප්‍රතිපාදනයෙන් **2020** දෙසැම්බර් **31** දිනට මෙම අරමුණු සඳහා සියයට **34.47**ක් නියෝජනය කරන එකතුව රු. මිලියන **5,602**කට සමාන එ.ජ.ඩො. මිලියන **29**ක් පමණක් උපයෝජනය කර තිබුණි.